AIA Insurance Lanka PLC (Co. No. PQ 18)
AIA Tower
P O Box 2088
92, Dharmapala Mawatha,
Colombo 07, Sri Lanka
T : (+94 11) 231 0000
F : (+94 11) 244 7620
E : lk.info@aia.com
AIALIFE.COM.LK

# කොටස් හිමිකරුවන් සඳහා වන චක්‍රලේඛය

හිතවත් කොටස් හිමියනි,

<u>සංශෝධිත බැහැරවීමේ යෝජනාව (Revised Exit Offer) - කොළඹ කොටස් වෙළඳපොලේ නිල ලැයිස්තුවෙන් AIA ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී හි සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය (ඡන්ද බලය සහිත) කොටස් ස්වේච්ඡාවෙන් ඉවත්කර ගැනීම</u>

ඔබ දන්නා පරිදි, AIA ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී (''AIA ඉන්ෂුවරන්ස් ලංකා'' හෝ ''සමාගම'') මගින් 2018 අගෝස්තු මස 20 වැනි දින පවත්වන ලද අති විශේෂ මහා සභා රැස්වීමේදී (''අගෝස්තු 20 අති විශේෂ මහා සභා රැස්වීම'') කොළඹ කොටස් වෙළඳපොලේ පවතින නිකුත් කරන ලද සහ සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය (ඡන්ද බලය සහිත) කොටස් (කොටස හෝ කොටස්) ස්වේච්ඡාවෙන් ඉවත් කරගැනීම සඳහා කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය විමසන ලදී.

2001 දෙසැම්බර් 18 වැනි දින හා අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ (ඉවත් කිරීමේ නීති) ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති පරිදි ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිසමේ නීතිරීති අනුගමනය කරමින් 2018 අගෝස්තු 20 වැනි දින අති විශේෂ මහා සභා රැස්වීමේදී සිදුකරන ලද අත් ඔසවා ඡන්ද විමසීමේදී, පැමිණි සංඛ්‍යාවෙන් විශේෂ බහුතරය ලබාගැනීමේ යෝජනාව ව්‍යර්ථ විය. අගෝස්තු 20 වැනි දින පැවති අති විශේෂ මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මූලික කරුණ වූයේ AIA ඉන්ෂුවරන්ස් ලංකාහි ප්‍රධාන කොටස් හිමිකරු වන හොං කොං, **වන්චායි, 1 ස්ටබ්ස් මාවත, 12 මහලේ සීමාසහිත AIA සමාගම ("AIA CO") මගින් ඉදිරිපත් කරන ලද කොටසකට ශ්‍රී ලංකා රුපියල් දහසක (රු.1,000/-) බැහැර වීමේ මිල (Exit Offer) තීරණය කිරීමේදී සමාගමෙහි අන්තර් කේන්ද්‍රීය වටිනාකම (Embedded Value)** පිළිබඳව සැළකිල්ලට ගෙන ඇති බවක් විදහා නොදැක්වෙන බවයි.

සමාගමෙහි කොටස් වල වටිනාකම තක්සේරු කිරීමේදී අන්තර් කේන්ද්‍රීය වටිනාකම යන සංකල්පය අදාළ නොවන බවට AIA ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය (''මණ්ඩලය'') මතයක් දැරුවද, සමාගමෙහි ආයුගණක ෆ්‍රෑන්ක් මුන්රෝ මහතා වෙතින් අන්තර් කේන්ද්‍රීය වටිනාකම **(Embedded Value)** මත පදනම්ව ස්වාධීන වෘත්තීයමය ආයුගණන තක්සේරුකරණයක් සිදුකරමින් කොටස් හිමිකරුවන්ගේ අවධානය යොමුවූ කරුණ සලකා බැලීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කලේය. මෙම තක්සේරුකරණය ප්‍රයිස්වෝටර්හවුස් කූපර්ස් වරලත් ගණකාධිකාරීවරුන් (M/s PricewaterhouseCoopers, Chartered Accountants) විසින් විමර්ශනය කොට වලංගු බවට නිර්දේශ කෙරිණි. තවද, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සීමාසහිත කැපිටල් එලායන්ස් පාර්ට්නර්ස් (Capital Alliance Partners Limited) වෙතින් 2018 ජූලි 23 වැනි දිනට සමාගමේ කොටසක වටිනාකම පිළිබඳ ස්වාධීන වෘත්තීයමය තක්සේරුකරණ විමර්ශන වාර්තාවක් ලබාගත් අතර එහි 2019 පෙබරවාරි 28 වැනි දිනට යාවත්කාලීන කරන ලද වාර්තාවක්ද ලබා ගනු ලැබිණි. තවදුරටත් කැපිටල් එලායන්ස් පාර්ට්නර්ස්හි තක්සේරුකරණය පිළිබඳ ස්වාධීන වෘත්තීයමය විමර්ශනයක් අර්න්ස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරීවරුන් (M/s Ernst & Young, Chartered Accountants) වෙතින් ද ලබාගැනීමටද අධ්‍යක්ෂක මණ්ඩලය කටයුතු කලේය. මෙම එක් එක් තක්සේරුකරණයන් මගින් (අන්තර් කේන්ද්‍රීය වටිනාකම **(Embedded Value)** මත සිදු කරන ලද තක්සේරුකරණයන්ද ඇතුළත්ව) තහවුරු කරන ලද්දේ 2018 අගෝස්තු 20 අති විශේෂ මහා සභා රැස්වීමේදී AIA CO මගින් ඉදිරිපත් කරන ලද එක් කොටසකට රුපියල් 1,000/- වූ බැහැර වීමේ මිල **(Exit Offer)** සමාගමේ කොටස් සඳහා සාධාරණ වූ, සහ තවදුරටත් සාධාරණ මිලක් බවයි.

**තත්ත්වය එසේ තිබියදීත්, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් AIA CO වෙතින් කොටසකට ශ්‍රී ලංකා රුපියල් දෙදහස් පන්සීයක (රු.2,500/-) ක සංශෝධිත බැහැරවීමේ මිලක් (සංශෝධිත බැහැරවීමේ යෝජනාව) ලබා ගෙන ඇත**.

අධ්‍යක්ෂක මණ්ඩලය දැන්, අදාළ කොටස් හිමියන්ගේ සහ නියාමන අනුමැතීන්ට යටත්ව, කොටසකට ශ්‍රී ලංකා රුපියල් දෙදහස් පන්සීයක (රු 2,500/-) සංශෝධිත බැහැරවීමේ යෝජනාව මත පදනම්ව කොළඹ කොටස් වෙළඳපොලේ නිල ලැයිස්තුවෙන් සමාගමේ කොටස් ඉවත් කරගැනීම සඳහා කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය අපේක්ෂා කරයි.

ඉහත කරුණ සම්බන්ධයෙන් කොළඹ කොටස් වෙළඳපොල වෙත 2019 පෙබරවාරි 28 වැනි දින නිවේදනයක් නිකුත් කොට ඇත. ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිසමේ නීතිරීති හා රෙගුලාසි ප්‍රකාරව, කොළඹ කොටස් වෙළඳපොල මගින් 2019 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි අදාළ කොටස් සම්බන්ධව ගනුදෙනු අත්හිටුවීමක් පනවනු ලැබ ඇත.

මෙම චක්‍රලේඛය මගින්, සංශෝධිත බැහැරවීමේ යෝජනාව, යෝජිත පරිදි කොටස් වෙළඳපොලෙන් සමාගමේ කොටස් ඉවත් කිරීම, සහ 2019 මාර්තු 27 වැනි දින මෙම අරමුණ උදෙසා පැවැත්වීමට යෝජිත අති විශේෂ මහා සභා රැස්වීම සම්බන්ධයෙන් වැදගත් වන විස්තර ප්‍රකාශයට පත් කෙරේ.

මෙම චක්‍රලේඛය හා සමගාමීව ඔබට කියවා බැලිය හැකි අමතර විස්තර (මෙම චක්‍රලේඛය අවසානයේ ලැයිස්තුගත කොට ඇති පරිදි) කඩිනමින් ඔබ වෙත ලැබීමට සැලැස්වෙනු ඇත. තවද, කොටස් හිමිකරුවන්ගේ පහසුව තකා මෙම එක් එක් අමතර ලේඛනයන්හි මෘදු පිටපත් මෙන්ම මෙම චක්‍රලේඛයෙහි සිංහල හා දෙමළ පරිවර්තනයන්ද AIA ඉන්ෂුවරන්ස් ලංකා වෙබ් අඩවියෙහි පළ කෙරෙනු ඇත. කෙසේවුවද මෙම චක්‍රලේඛයෙහි බලාත්මක පිටපත වනුයේ ඉංග්‍රීසි පිටපතයි. පරිවර්තිත චක්‍රලේඛයෙහි දෘඪ පිටපතක් ලබාගැනීමට අවශ්‍ය කොටස් හිමිකරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලබන්නේ, 2019 මාර්තු 25 වැනි දිනට පෙර ඕනෑම කාර්යාලයීය දිනයක පෙ.ව. 8.30 සිට ප.ව. 5.00 දක්වා AIA ඉන්ෂුවරන්ස් ලංකා දුරකථන අංක (0094) 112310761 ඔස්සේ, විධායක නිලධාරිනී, අමැන්ඩා අබේගුණසේකර අමතන ලෙස හෝ LKE_comsec@aia.com වෙත ඊ මේල් පණිවුඩයක් යොමු කරන ලෙසයි.

සංශෝධිත බැහැරවීමේ යෝජනාව සම්බන්ධයෙන් හේතු සහගත සහ දැනුවත්භාවයෙන් යුතු විනිශ්චයක් වෙත එළඹීම උදෙසා, මෙම චක්‍රලේඛය සහ ඉහත සඳහන් කරන ලද අමතර ලේඛන* (ලද පසු) සැළකිලිමත්ව විමර්ශනය කොට මෙහි සඳහන් කරුණු පිළිබඳ ස්වාධීන මාර්ගෝපදේශයන් කෙරෙහි යොමු වන මෙන් කොටස් හිමිකරුවන් වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

## 1. ස්වේච්ඡාවෙන් කොටස් ඉවත් කිරීම සඳහා වන පසුබිම සහ හේතු

2018 ජූලි 25 වැනි දිනැති කොටස් හිමිකරුවන් වෙත වූ පෙර චක්‍රලේඛයෙහි (සමාගමේ වෙබ් අඩවියේ දක්වා ඇති ) කොටස් හිමිකරුවන් හට විස්තරාත්මකව පැහැදිලි කරන ලද පරිදි, 2017 ඔක්තෝබර් 19 වැනි දින බලාත්මක වූ 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත (රක්ෂණ සංශෝධන පනත) මගින්, කිසියම් දේශීය රක්ෂණ සමාගමක කොටස් වලින් අවම වශයෙන් සියයට අසූ පහක් (85%) ලෝක විනිමය සම්මේලනයෙහි (World Federation of Exchanges) සාමාජිකත්වය සහිත කොටස් වෙළඳපොලක හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (රක්ෂණ නියාමන කොමිසම) විසින් පිළිගත් වෙනත් එවැනි සංවිධානයක ලැයිස්තුගත විදේශීය මව් සමාගමක් සතු වේ නම් හා රක්ෂණ නියාමන කොමිසම මගින් පිළිගත් සෙසු විශේෂිත වාර්තා කිරීමේ ක්‍රියාපටිපාටීන් සම්පූර්ණ කරන්නේ නම් එවැනි දේශීය රක්ෂණ සමාගම් කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමේ අධිකාරී බලය රක්ෂණ නියාමන කොමිසම වෙත පවරන ලදී.

AIA ඉන්ෂුවරන්ස් ලංකා යනු සීමාසහිත AIA සමූහයේ (AIA සමූහය) (AIA Group Limited) සාමාජිකයෙකි. AIA සමූහය, කවුන්ටරය හරහා ගනුදෙනු කෙරෙන ඇමරිකානු තැන්පතු ලදුපත් සහිත (මට්ටම 1), කොටස් කේත අංක 1299 යටතේ ලෝක විනිමය සම්මේලනයෙහි (World Federation of Exchanges) සාමාජිකයකු වන, සීමාසහිත හොංකොං කොටස් වෙළඳපළෙහි ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගතය (කොටස් සංකේතය “AAGIY”). AIA සමූහය සහ එහි පරිපාලිතයන්, AIA CO ද (AIA ඉන්ෂුවරන්ස් ලංකා හි 97.16% ක බලාත්මක කොටස් හිමිකාරීත්වයක් සහිත) ඇතුළත්ව, වෙළඳපොල ප්‍රාග්ධනීතය අනුව විශාලතම මහජන ලැයිස්තුගත ආසියා ශාන්තිකර ජීවිත රක්ෂණ සමූහය වන අතර එය ආසියා ශාන්තිකර කළාපයේ වෙළඳපොල 18 ක මෙහෙයුම් කටයුතු සිදුකරයි. AIA ඉන්ෂුවරන්ස් ලංකාද ඇතුළත්ව ස්වකීය පරිපාලිතයන් සම්බන්ධයෙන් AIA සමූහය මගින් භාවිත කෙරෙන මූලික මෙහෙයුම් ආකෘතිය වනුයේ, ස්වකීය සේවාලාභීන්, ප්‍රජාව සහ සමූහය වෙත සමස්තයක් වශයෙන් ප්‍රතිලාභ

අත්වන පරිදි ව්‍යාපාරයේ ලාභ ප්‍රති ආයෝජනය සදහා රදවා ගනිමින්, දිගු කාලීන වටිනාකම් නිර්මාණය කිරීම සදහා අවධානය යොමු කළ හැකි වන පරිදි පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතයන් ඔස්සේ ව්‍යාපාර කටයුතු වල නිරත වීමයි. AIA ඉන්ෂුවරන්ස් ලංකා හි යෝජිත කොටස් ඉවත් කරගැනීමේ ක්‍රියාවලිය තුළින් අපේක්ෂා කෙරෙනුයේ, AIA ඉන්ෂුවරන්ස් ලංකා ද ඉහත දක්වන ලද AIA සමූහයේ සමස්ත මෙහෙයුම් ව්‍යුහය තුළට ගැළපෙන අයුරින් ඇතුළත් කිරීමයි.

2013 දී AIA ඉන්ෂුවරන්ස් ලංකා අත්පත් කරගැනීමේ කාලපරිච්ඡේදයේ සිටම, AIA ඉන්ෂුවරන්ස් ලංකා ලැයිස්තුගත නොවූ සමාගමක් වශයෙන් පවත්වා ගෙන යාමේ සිය අරමුණ AIA සමූහය මගින් අනාවරනය කොට තිබුණද, එසේ සිදුකිරීමට අපොහොසත් වූයේ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත මගින් සියලුම දේශීය රක්ෂණ සමාගම් ලැයිස්තුගත සමාගම් බවට පත්වීමේ අවශ්‍යතාවයක් පැවති බැවිනි. කෙසේවුවද, 2017 ඔක්තෝබර් 19 වැනි දින රක්ෂණ සංශෝධන පනත ක්‍රියාත්මක වීමත් සමග, AIA ඉන්ෂුවරන්ස් ලංකා ලැයිස්තුගත තත්ත්වයෙන් ඉවත් කරගැනීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම කෙරෙහි AIA සමූහයේ අවධානය යොමු විය.

ඒ අනුව, සීමාසහිත හොංකොං කොටස් වෙළඳපොලෙහි ප්‍රධාන පුවරුවේ AIA සමූහය (AIA ඉන්ෂුවරන්ස් ලංකා හි පරම හිමිකාර සමාගම/මව් සමාගම) ලැයිස්තුගත වීම පදනම් කරගනිමින් දේශීය ලැයිස්තුගත වීමෙන් නිදහස් වීම සදහා වන ඉහත සදහන් කරන ලද රක්ෂණ සංශෝධන පනතෙහි ක්‍රියාපටිපාටිය AIA ඉන්ෂුවරන්ස් ලංකා මගින් සම්පූර්ණ කර රක්ෂණ නියාමන කොමිසම සෑහීමකට පත් කොට ඇති බැවින්, AIA ඉන්ෂුවරන්ස් ලංකා මගින් 2018 ජූලි 20 වැනි දින කොළඹ කොටස් වෙළඳපොල වෙත අනාවරනය කරන ලද පරිදි එවැනි නිදහස් කිරීමක් හිමි කර ගන්නා ලදී.

අද දින වන විට මහජන කොටස් හිමිකාරීත්වය 2.84% ක් වැනි සුලු ප්‍රතිශතයක පවතින බැවින් AIA ඉන්ෂුවරන්ස් ලංකා, කොළඹ කොටස් වෙළඳපොල ලැයිස්තුගත කිරීමේ නීතිරීති ආශ්‍රිත අවශ්‍යතාවයක් වන අවම මහජන කොටස් හිමිකාරීත්වයද සපුරාලීමට අපොහොසත් වේ. AIA ඉන්ෂුවරන්ස් ලංකා මගින් 2018 ජූලි 19 වැනි දින කොළඹ කොටස් වෙළඳපළ වෙතින් ඉහත සදහන් කරන ලද අවශ්‍යතාවයෙන් තාවකාලික නිදහස් වීමක් ලබාගෙන ඇත. කෙසේවුවද, ඉහත නිදහස් කිරීමේ කාලසීමාව ඉකුත් වන විටදිද ස්වකීය පාලනයෙන් ඔබ්බෙහි පවතින හේතු කාරණා නිසාවෙන්, ඉහත සදහන් කරන ලද ලැයිස්තුගත කිරීමේ නීතිරීති යටතේ වන අවශ්‍යතාවය සපුරාලීමට AIA ඉන්ෂුවරන්ස් ලංකා අපොහොසත් වනු ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපල මත රදාපැවැත්මකින් තොරව ශ්‍රී ලංකාව තුළ ඇති සිය ආයෝජන සැලසුම් සදහා අභ්‍යන්තර වශයෙන් අරමුදල් සම්පාදනය කිරීමේ හැකියාව සමූහය සතු වන බව AIA ඉන්ෂුවරන්ස් ලංකා ප්‍රකාශ කරයි. තවද, AIA ඉන්ෂුවරන්ස් ලංකා ද ඇතුළත්ව සිය පරිපාලිතයන් සදහා වන AIA සමූහයේ මෙහෙයුම් ආකෘතිය අනුව, ප්‍රති ආයෝජනය සහ දිගු කාලීන වටිනාකම් නිර්මාණය සදහා ලාභය රදවා ගැනීම කෙරෙහි අවධානය යොමු වන අතර අනාගතයේදීද එය එසේ සිදු වනු ඇත. AIA සමූහය මගින් AIA ඉන්ෂුවරන්ස් ලංකා අත්පත් කරගනු ලැබූ කල සිට AIA ඉන්ෂුවරන්ස් ලංකා මගින් සැළකිය යුතු ලාභාංශ බෙදාහැරීම් සිදුකළද, 2015 දී AIA ඉන්ෂුවරන්ස් ලංකා හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය බැහැර කිරීම සහ 2017 දී සිදුවූ කැපී පෙනෙන පොලී අනුපාත පහළ යාම සහ ශ්‍රී ලංකාව තුළ පවතින අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ද්‍රවශීලතා අවශ්‍යතාවය (Risk Based Capital solvency regime) හේතුවෙන් උද්ගත වූ අතිරික්තය හි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යතිරේකී තත්ත්වයන්දි ඇති විය. මෙකී ව්‍යතිරේකයන් හැරුනුකොට, AIA ඉන්ෂුවරන්ස් ලංකා මගින් පසුගිය වසර කිහිපය තුළ ලාභාංශ නිකුත් කිරීම පහත වැටීමේ ප්‍රවණතාවය මගින් මනාව පැහැදිලි වන පරිදි, AIA සමූහයේ ප්‍රමුඛ අවධානය යොමු වනුයේ සිය ලාභයෙන් වැඩි කොටසක් ප්‍රති උත්පාදනය සහ ප්‍රති ආයෝජනය කෙරෙහි වන බවයි.

මෙම තත්ත්වයන් හා කිසිදු නීති රීතියක් මගින් AIA ඉන්ෂුවරන්ස් ලංකා ලැයිස්තුගත සමාගමක් වීමේ අවශ්‍යතාවයක් මතු නොවීම තුළ, AIA සමූහය මගින් AIA ඉන්ෂුවරන්ස් ලංකා කොළඹ කොටස් වෙළඳපොළ ලැයිස්තුගත තත්ත්වයෙන් ඉවත් කරගැනීම සදහා කටයුතු කිරීමට තීරණය කරනු ලබන්නේ, එවිට පරිපාලිතයක් වශයෙන් AIA ඉන්ෂුවරන්ස් ලංකා හි තත්ත්වය, සිය නියෝජනය සහිත වෙනත් වෙළඳපොල පුරා AIA සමූහයේ මෙහෙයුම් ආකෘතිය සමග නිරන්තරයෙන් ගළපනු පිණිසය.

## 2. සංශෝධිත බැහැරවීමේ යෝජනාව

AIA CO හි සංශෝධිත බැහැරවීමේ යෝජනාව මුදලින්, කොටසකට ශ්‍රී ලංකා රුපියල් දෙදහස් පන්සීයකි (රු 2,500/-). සංශෝධිත බැහැරවීමේ යෝජනාව අවසන් යෝජනා කිරීම වන අතර මින් පසු AIA CO මගින් කිසිදු ස්වේච්ඡා කොටස් ඉවත් කරගැනීමේ යෝජනාවක් සිදු නොකොරේ.

පෙර සදහන් කළ පරිදි ඉතා නුදුරේදීම ඔබ වෙත ලැබීමට සලස්වනු ලබන්නා වූ AIA ඉන්ෂුවරන්ස් ලංකා වෙත හිමි වූ ඉහත දක්වන ලද ස්වාධීන වෘත්තීයමය වාර්තාවන් සහ විමර්ශයන් මත පදනම්ව මුල් බැහැරවීමේ යෝජනාව මෙදින වන විටද, කොටස් සදහා ආකර්ශනීය සහ සාධාරණ මිළක් වන අතර, එහිදී සළකාබලන ලද එක් එක් එකිනෙකට වෙනස් වූ සහ යාවත්කාලීන වූ කොටස් තක්සේරුකරණ ක්‍රමවේදයන් ඔස්සේ කොටසකට වෙන් කරන ලද වටිනාකම මත අධිමිලක් නියෝජනය කර ඇත.

AIA ඉන්ෂුවරන්ස් ලංකා සංශෝධිත බැහැරවීමේ මිල පිළිබදව පහත කරුණු බව පෙන්වා දීමට අපේක්ෂා කරයි.

(අ) සංශෝධිත බැහැරවීමේ මිල 2019 පෙබරවාරි 28 වැනි දින අවසන් වූ මාස 12 කාල පරිච්ඡේදය පුරා දෛනික පරිමා බර තබන ලද වෙළදපොල මිල වෙත 204% ක කොටස් අධිමිලක් නිරූපනය කරයි :

(ආ) සංශෝධිත බැහැරවීමේ මිල 2019 පෙබරවාරි 28 වැනි දින අවසන් වූ මාස 12 කාල පරිච්ඡේදය පුරා ගනුදෙනු කරන ලද ඉහළම මිලට 26% ක අධිමිලකි :

(ඇ) සංශෝධිත බැහැරවීමේ මිල 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සදහාවන අතුරු මූල්‍යමය ප්‍රකාශනයන් හි වාර්තා වූ පරිදි කොටසක ශුද්ධ වත්කම් වටිනාකමට වඩා 311% ඉහළ මිලකි: සහ

(ඈ) ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ සන්සන්දනය කළ හැකි සමාගම් වලට සාපේක්ෂව, පොත් අගයට මිල සාපේක්ෂ ක්‍රමවේදය අනුව තීරණය කරන ලද සාධාරණ මිල මත 166% ක අධිමිල ක පවතී :

(ඉ) 2018 ජූනි 30 වැනි දිනට AIA ඉන්ෂුවරන්ස් ලංකාහි අන්තර් කේන්ද්‍රීය වටිනාකමට **(Embedded Value)** වඩා 264% ඉහළ මිලකි.

**AIA ඉන්ෂුවරන්ස් ලංකාහි කොටස් මිල පිළිබද විශ්ලේෂණය**

2019 පෙබරවාරි 28 දින අවසන් වූ මාස 12 ක කාලපරිච්ඡේදය සදහා AIA ඉන්ෂුවරන්ස් ලංකාහි කොටස් වල වෙළදපොල මිල පිළිබද විමර්ශනයක් පහත දැක්වේ -

| මාසය | ඉහළ රු | පහළ රු | අවසන් වරට ගනුදෙනු කර ලද රු | දෛනික පරිමා බර තබන ලද සාමාන්‍යය රු |
|---|---|---|---|---|
| 2018 මාර්තු | 400.00 | 335.00 | 384.00 | 374.59 |
| 2018 අප්‍රියෙල් | 445.00 | 388.20 | 400.20 | 417.81 |
| 2018 මැයි | 544.00 | 407.00 | 500.00 | 471.37 |
| 2018 ජූනි | 545.00 | 502.00 | 524.60 | 523.44 |
| 2018 ජූලි | 530.00 | 510.20 | 525.20 | 519.56 |
| 2018 අගෝස්තු | 656.50 | 656.50 | 525.20 | 525.20 |
| 2018 සැප්තැම්බර් | 999.00 | 656.50 | 900.00 | 906.17 |
| 2018 ඔක්තෝබර් | 988.90 | 900.00 | 956.80 | 926.34 |
| 2018 නොවැම්බර් | 991.00 | 900.00 | 990.00 | 961.83 |
| 2018 දෙසැම්බර් | 1990.00 | 975.00 | 1707.60 | 1544.76 |
| 2019 ජනවාරි | 1850.00 | 1500.00 | 1840.80 | 1728.65 |
| 2019 පෙබරවාරි | 1889.90 | 1349.80 | 1555.00 | 1752.14 |
| මාස 12 කාලපරිච්ඡේදය 2018 මාර්තු සිට 2019 පෙබරවාරි | 1990.00 | 335.00 | 1555.00 | 822.33 |

ප්‍රසිද්ධ වූ නවතම තොරතුරු අනුව 2018 දෙසැම්බර් 31 දිනට කොටසක ශුද්ධ වත්කම් අගය රු. 608.14 කි. මෙම තත්ත්වයන් තුළ අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස වනුයේ සංශෝධිත බැහැරවීමේ යෝජනාවේ සංශෝධිත බැහැරවීමේ මිල කොටස් වල සාධාරණ මිල ඉක්මවන බැවින් කොටස් හිමිකරුවන් වෙත එය නිර්දේශ කරන බවයි.

සංශෝධිත බැහැරවීමේ යෝජනාව කොන්දේසි විරහිත වන අතර තමන්ගේ නිසි පරිදි ලියාපදිංචි වූ කොටස් අලෙවි කිරීමට අපේක්ෂා කරන කොටස් හිමිකරුවන් හට යෝජිත කොටස් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලැබීමත් සමග අදාළ යෝජනාව බාරගත හැකි වේ. කොටස් හිමිකරුවන්හට සංශෝධිත බැහැරවීමේ යෝජනාව පිළිගැනීමට බැඳීමක් නැත. යෝජිත කොටස් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලැබීමෙන් පසුවද AIA ඉන්ෂුවරන්ස් ලංකාහි ඔවුන්ගේ අදාළ කොටස් හිමිකාරීත්වය රඳවා තබා ගැනීමට අපේක්ෂා කරන කොටස් හිමිකරුවන් හට එය එසේ සිදුකළ හැකි වේ.

AIA ඉන්ෂුවරන්ස් ලංකාහි සුලුතර කොටස් හිමිකරුවන්ගේ කොටස් අත්පත් කරගැනීම සඳහා තවදුරටත් කිසිදු කොටස් ඉවත් කිරීමේ යෝජනාවක් සිදුකිරීමට AIA CO අදහස් නොකරන බවට කොටස් හිමිකරුවන් වෙත උපදෙස් දෙනු ලැබේ. සංශෝධිත බැහැරවීමේ යෝජනාව ප්‍රතික්ෂේප වූ අවස්ථාවකදී තම ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරකම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වෙනත් විකල්ප කෙරෙහි අවධානය යොමු කරන බවට AIA CO මගින් උපදෙස් ලබාදී ඇත.

3 ව්‍යවස්ථාපිත සහ නියාමන ක්‍රියාපටිපාටිය කෙරෙහි අනුකූලතාවය

මෙම යෝජිත කොටස් ඉවත් කිරීම අදාළ නීතිරීති (Delisting Rules) වලට අනුකූලව සිදු කෙරේ.

ඒ අනුව, මෙහි දැක්වෙන 2019 මාර්තු 27 වැනි දින පැවැත්වීමට නියමිත අති විශේෂ මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව, AIA ඉන්ෂුවරන්ස් ලංකා මගින් යෝජිත කොටස් ඉවත් කිරීම සඳහා අවශ්‍ය සහායක ලියකියවිලි ද සමග ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම වෙත අයදුම්පතක් යොමු කරන අතර, අදාළ අරමුණ ක්‍රියාවේ යෙදවීම සඳහා අදාළ වන සෙසු සියලු කරුණු කෙරෙහි යොමු වනු ඇත.

4 කොටස් ඉවත් කිරීමේ බලපෑම

කොළඹ කොටස් වෙළඳපොලේ නිල ලැයිස්තුවෙන් කොටස් ඉවත් කිරීම සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, AIA ඉන්ෂුවරන්ස් ලංකා පොදු ලැයිස්තුගත සමාගමක් වශයෙන් පැවතීම අවසන් වන අතර එහි තත්ත්යට සීමාසහිත සමාගමක් (පොදු ලැයිස්තුගත නොවූ) බවට වෙනස් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2007 අංක 7 දරන සමාගම් පනතෙහි S.11 (4) වගන්තිය ප්‍රකාර එහි නාමය ''AIA ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී'' AIA Insurance Lanka PLC) වෙනුවට ''සීමාසහිත AIA ඉන්ෂුවරන්ස් ලංකා" (AIA Insurance Lanka Limited) යනුවෙන් වෙනස් වේ.

තවද, AIA ඉන්ෂුවරන්ස් ලංකාහි වර්තමාන සාංගමික ව්‍යවස්ථාවලිය සමාගමෙහි තත්ත්වය වෙනස් වූ අයුරු විදහා දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ. AIA ඉන්ෂුවරන්ස් ලංකා හි ලැයිස්තුගත තත්ත්වය හා සම්බන්ධ විධිවිධාන ඉවත් කිරීම/ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන යෝජනා අති විශේෂ මහා සභා රැස්වීම කැඳවීම සඳහා මෙයට අමුණන ලද දැන්වීමෙහි ඇතුළත් විශේෂ යෝජනා අංක 2 හි දැක්වේ. සාංගමික ව්‍යවස්ථාවලිය වෙත සිදුකෙරෙන එවැනි සංශෝධන, අති විශේෂ මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන් විසින් සම්මත කිරීමෙන් අනතුරුව, 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධාන ප්‍රකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කිරීමට නියමිත සහතික පත්‍රයෙහි සඳහන් දින සිට බලාත්මක වේ.

5 අති විශේෂ මහා සභා රැස්වීම

යෝජිත කොටස් ඉවත් කරගැනීම සම්බන්ධ කරුණු සඳහා කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය ලබාගැනීමේ අරමුණ උදෙසා වන අති විශේෂ මහා සභා රැස්වීම 2019 මාර්තු 27 වැනි දින, එම දිනයේම පෙ. ව. 9.15 ට කැඳවනු ලැබ ඇති වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වූ වහාම කොළඹ 7, ධර්මපාල මාවත, අංක 92, AIA ටවර් හි, AIA ඉන්ෂුවරන්ස් ලංකා (හය වැනි මහල) දී පැවැත්වේ. මේ සම්බන්ධ කොටස් හිමිකරුවන්ගේ නිසි අනුමතියක් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද අවශ්‍ය විශේෂ යෝජනා අති විශේෂ මහා සභා රැස්වීම සම්බන්ධ දැන්වීමෙහි සඳහන් වේ.

සංශෝධිත බැහැරවීමේ යෝජනාව, කොටස් ඉවත් කිරීම සඳහා ප්‍රකාශිත යෝජිනා කොටස් හිමිකරුවන් විසින් සම්මත කිරීමට යටත් වේ. සිය ඡන්දය කවරාකාරයෙන් භාවිත කරන්නේදැයි යන්න තීරණය කිරීම සඳහා, මෙහි සඳහන් කරුණු පිළිබඳව ස්වාධීන විමසීම් සහ හෝ වෘත්තීය උපදෙස් ලබාගන්නා මෙන් කොටස් හිමිකරුවන් දිරිගැන්වේ.

අති විශේෂ මහා සභා රැස්වීම සදහා තමන් විසින්ම සහභාගී විය නොහැකි කොටස් හිමිකරුවන් හට ඔවුන් වෙනුවෙන් සහභාගී වී ඡන්දය ප්‍රකාශ කිරීම සදහා ප්‍රොක්සි නියෝජිතයෙක් පත් කිරීමේ අවසරය හිමි වේ. ඔබ එවැනි ප්‍රොක්සි නියෝජිතයකු පත් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, කරුණාකර ප්‍රොක්සි පෝරමය නිසි පරිදි සම්පූර්ණ කොට (එහි විශේෂිතව දක්වා ඇති උපදෙස් අනුව), අති විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 48 කට නොඅඩු කාලයක් තුළ කොළඹ 7, ධර්මපාල මාවත, අංක 92, AIA ටවර් හි , සමාගමෙහි ලියාපදිංචි කාර්යාලයට නැවත භාර දෙන්න. එවිට ඔබේ ප්‍රොක්සි නියෝජිතයා හට රැස්වීමට සහභාගී වී ඔබේ උපදෙස් පරිදි ඔබේ ඡන්දය ප්‍රකාශ කළ හැකි වේ. කිසියම් කොටස් හිමිකරුවකු ඔහුගේ/ඇයගේ ප්‍රොක්සි නියෝජිතයා වෙනුවට ඔහු/ඇය විසින්ම අති විශේෂ මහා සභා රැස්වීම සදහා සහභාගී වී ඡන්දය භාවිත කිරීමට අපේක්ෂා කරන්නේ නම් එවැනි කොටස් හිමිකරුවකු විසින් එයට පෙරාතුව ප්‍රොක්සි අයදුම්පතක් භාර දී පැවතීම එයට බාධාවක් නොවේ.

මෙයට විශ්වාසී,
AIA ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

චතුරි මුණවීර
සමාගම් ලේකම්
2019 මාර්තු 01

2019 මාර්තු 5 වැනි දින වන විට කොටස් හිමිකරුවන් වෙත ලැබීමට සැලැස්වීමට නියමිත අමතර ලියකියවිලි*

(1) AIA ඉන්ෂුවරන්ස් ලංකා හි ප්‍රධාන ආයුගණක, ෆ්‍රෑන්ක් මුන්රෝ මහතා FIA (U.K.), විසින් සපයන ලද අන්තර් කේන්ද්‍රීය වටිනාකම **(Embedded Value)** තක්සේරුකරණ සහතිකයේ සාරාංශය.
(2) අන්තර් කේන්ද්‍රීය වටිනාකම **(Embedded Value)** තක්සේරුකරණය පිළිබඳව 2019 පෙබරවාරි 28 වැනි දින ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් වරලත් ගණකාධිකාරීවරුන්ගේ (M/s PricewaterhouseCoopers, Chartered Accountants) ස්වාධීන විමර්ශන වාර්තාව.

(3) සීමාසහිත කැපිටල් එලායන්ස් පාර්ට්නර්ස් වෙතින් 2018 ජූලි 23 වැනි දින නිකුත් කරන ලද ස්වාධීන තක්සේරුකරණය සහ, 2019 පෙබරවාරි 28 වැනි දින නිකුත් කරන ලද යාවත්කාලීන කරන ලද වාර්තාව.

(4) සීමාසහිත කැපිටල් එලායන්ස් පාර්ට්නර්ස් තක්සේරුකරණය පිළිබඳ අර්න්ස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරීවරුන් (M/s Ernst & Young, Chartered Accountants) වෙතින් 2019 පෙබරවාරි 28 වැනි දින නිකුත් කරන ලද ස්වාධීන වෘත්තීයමය විමර්ශන වාර්තාවේ සාරාංශය.